ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2253/7 - 2021 නොවැම්බර් මස 08 වැනි සඳුදා - 2021.11.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39(අ)(1) වැනි වගන්තිය යටතේ නියමය

*මගේ යොමු අංකය* : 4-3/10/2012/LRB/221.
*ඉඩම් අත්කර ගැනීමේ නිලධාරීගේ අංකය* : WGSWD&EIP/ACQ/KB/13.

2013 ඔක්තෝබර් මස 04 දින අංක 1830/51 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති *විශෙෂ ගැසට්* පත්‍රයෙහි (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2013 අංක 298 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුලත් කරන ලද) 39 අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත I උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2021 නොවැම්බර් මස 02 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**1 වන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බොරලැස්ගමුව නැගෙනහිර ඒ-533 සහ වේරහැර උතුර-577 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසවල, වේරහැර සහ බොරලැස්ගමුව ගම්වල පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මු.පි.කො. 9594 හා 2016.01.15 දිනැති මුලික පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම් :

**01. කැබලි අංක 34 - ඉඩමේ නම : ඉදිගහවත්ත; ප්‍රමාණය : හෙක්. 0.0151**

*උතුරට* : 3 වන පටුමගෙහි වරිපනම් අංක 31/17 දරන ඉඩම; *නැගෙනහිරට* : කැබලි අංක 35; *දකුණට* : කැබලි අංක 35; *බටහිරට* : කැබලි අංක 33.

11 - 515



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධි පත්‍රය

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39(අ)(1) වැනි වගන්තිය යටතේ නියමය

*මගේ යොමු අංකය* : LD/05/2003/VEP/493.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය* : අඹකෝ/3/5/අ/150.

අංක 2146/35 හා 2019.10.25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* භාෂාත්‍රයෙන් පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමයේ ඉඩමේ විස්තරයෙහි, අංක 106 අතිරේක අංක 20 දරන අවසාන ගම් පිඹුරෙහි දිනය "2005.07.28" යන්න "2018.02.22" ලෙස නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2021 ඔක්තෝබර් මස 07 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11-516

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.